## 32

නොබා සිටිනට හැක්කෙ කොතැනද
දැනුම නිවහල් වූනේ කොතැනද
අපම නිපැයූ භේදයෙන් රට
කැබලි වී නොම යන්නෙ කොතැනද

අන්න ඒ රන් නිදහසේ දිව්‍යමය දේශය කරා
මගේ දේශය අවදි කළ මැන පියාණනේ

සත්‍යයේ ඇති ගැඹුරු පත්ලෙන්
වදන් වැල් නැඟ එන්නෙ කොතැනද
වෙහෙස නොබලන දිරිය දැතක්
පාරිශුද්ධිය කරා නැගුණිද

සම්ප්‍රදායික වියලි කතරක
දැක්ම ගඟුලක් වන්නෙ කොතැනද
චින්තනය නිති පුළුල් වන විට
ක්‍රියාවද එහි රැඳෙනු කොතැනද

